# නියඟයේ දුක්ගිනි නිවන්නට...

# Bg 251

**සී. එච්. පියසිරි**
වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය,
බතලගොඩ

**ඩබ්. එම්. ඩබ්. වීරකෝන්**
ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,
මහඉලුප්පල්ලම

**ඩී. එම්. එන්. දිසානායක, ආර්. එස්. කේ. කීර්තිසේන**
**ටී. කේ. ඉලංගකෝන්, ආර්. වලිසිංහ**
**එස්. ඒ. සෙනවිරත්න, එන්. එම්. පී. සෝමරත්න**
**එම්. ඩී. අබේසුන්දර**
වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය,
බතලගොඩ

**ඩබ්. එම්. යූ. එස්. ගීතිකා**
පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය,
හෝමාගම



අක්‍රමවත් වර්ෂාපතන රටාව ද දීගුකාලීන නියඟයන් ද වර්ෂා පෝෂිත ප්‍රදේශ වල වී ගොවිතැන අවදානමට ඇද දමමින් පවතී. 2012 යල කන්නයේදී හෙක්ටයාර 35,800 ක් පමණ වූ වගා බිම් ප්‍රමාණයක් නියඟයේ බලපෑමට ලක් වී වාර්ෂික වී නිෂ්පාදනය මිලියන මෙට්‍රික් ටොන් 1.13 ක් දක්වා අඩු වූ අතර, එය 2011 වර්ෂය හා සසඳන කල 41% ක් අස්වනු අඩු වීමකි. 2014 වර්ෂයේද හෙක්ටයාර 11,723 ක ප්‍රමාණයක් නියඟයෙන් හානි වූ බැවින් වාර්ෂික වී නිෂ්පාදනය මිලියන මෙට්‍රික් ටොන් 1.14 දක්වා පහත වැටුණි. එය 2013 වර්ෂයට සාපේක්ෂව 35.5% ක අඩුවීමකි. තවද වර්ෂා පෝෂිත ප්‍රදේශ වල ගොවීන්ගෙන් 35% ක් පමණ යල කන්නයේදී තම වී ගොවිතැන අත්හැර දමයි. මෙලෙස නියඟ තත්ත්ව හේතු කොට ගෙන වගා බිම් ප්‍රමාණය අඩු වීමත්, අස්වනු හානිය වැඩි වීමත් ජාතික වී නිෂ්පාදනය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. අනාගතයේදී මෙම තත්ත්වය උග්‍ර වේද නැතහොත් මහහැරී යයිද යන්න සැක සහිතය. මෙම අනපේක්ෂිත සිද්ධීන් හට මුහුණ දීමට සූදානම්ව සිටීම කාලීන අවශ්‍යතාවයක් මෙන්ම අනාගත පරපුර වෙනුවෙන් ඉටුකරන යුතුකමක්ද වන්නේය. මෙම තත්ත්වයට විසඳුම් ලෙස වර්ෂා පෝෂිත ප්‍රදේශ වල වගා කන්නයේ සුදුසුම කාල සීමාව හඳුනා ගැනීමත්, ගොවීන් ඒ පිළිබඳව දැනුවත් කිරීමත්, ජල හිඟ තත්ත්වයන්ට ඔරොත්තු දෙන කෙටි කාලීන වී ප්‍රභේද හඳුන්වා දීම සහ කාර්යක්ෂම ජල භාවිත ක්‍රමයන් යන තාක්ෂණයන් ගොවීන් කරා රැගෙන යාම අපගේ කාර්යභාරයයි. එම

නිසා ජල හිඟ තත්ත්වයන්ට ඔරොත්තු දෙන කෙටි කාලීන වී ප්‍රභේද අත්හදා බැලීම සහ ඒවා හඳුන්වා දීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

වර්තමානයේ වර්ෂා පෝෂිත ප්‍රදේශ වල යල කන්නයේදී බහුලව වගා කරන වී වගා වනුයේ ඊට 300 හා ඊට 250 යන වී වර්ගයන්ය. නමුත් යල කන්නයේදී මෙම වී වර්ග වල මල සලකුණු වීමේ සිට කිරි වැදීම දක්වා වූ අවස්ථාවන් උග්‍ර ජල හිඟතාවයකට පාත්‍ර වුවහොත් ඒවායේ අස්වැන්න පිළිබඳ බලාපොරොත්තු තබා ගත නොහැකි වේ. එම නිසා මෙවැනි උග්‍ර ජල හිඟතාවයක් ඇති වර්ෂාපෝෂිත ප්‍රදේශ සඳහා නියඟයට ඔරොත්තු දෙන කෙටි කාලීන වී ප්‍රභේදයන් හි අවශ්‍යතාවය දැඩිව පවති.

බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන අයතනයේ ශෂ්‍ය විද්‍යාත්මක අංශ 2008 වසරේ සිට නියඟයට ඔරොත්තු දෙන වී ප්‍රභේද හඳුනා ගැනීමේ පර්යේෂණ වල නියැලෙමින් සිටී. මෙම වැඩසටහනට අදාලව අන්තර්ජාතික සහල් පර්යේෂණ ආයතනයට අනුබද්ධ GSR ව්‍යාපෘතිය හරහා නියඟයට ඔරොත්තු දෙන ජාන සහිත වී ප්‍රභේද 31 ක් ලැබුණු අතර එම වී ප්‍රභේද මෙම ආයතනය තුළ වර්ෂා පෝෂිත ජල හිඟ තත්ත්වය යටතේ පර්යේෂණයට භාජනය කරන ලදී. එම වී ප්‍රභේද අතුරින් ජල හිඟ තත්ත්වයන්ට ඔරොත්තු දෙන දින 75 වයස ඇති සුදු දිග නාඩු වී ප්‍රභේදයක් හඳුනා ගත් අතර පසුව එය Bg 10 - 9028 ලෙස නම් කරන ලදී. පර්යේෂණ දත්ත වලට අනුව වර්ෂා පෝෂිත උග්‍ර ජල හිඟ තත්ත්ව යටතේ මෙම වී ප්‍රභේදය අක්කරයට බුසල් 20 - 30 ක් පමණ ලබා දුන් අතර සාමාන්‍ය ජල හිඟ තත්ත්වය යටතේදී අක්කරයට බුසල් 66 ක් පමණ ලබාදුනි.

2011 යල කන්නයේදී, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ගල්ගමුව, මහව, ඉබ්බාගමුව සහ කුලියාපිටිය යන පළාත් කෘෂිකර්ම කලාප වලට අයත් වර්ෂාපෝෂිත ගොවි ක්ෂේත්‍ර 17 ක මෙම වී වර්ගය අත්හදා බැලීම සිදු කළ අතර ජල හිඟ තත්ත්ව යටතේ සාමාන්‍ය අස්වැන්න ලෙස අක්කරයට බුසල් 65 ක් වාර්තා වී තිබේ. තවද මෙම වී වර්ගය ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන් තුළ ජලය බැඳ තබන තත්ත්වය යටතේ වියළි කලාපය තුළ අක්කරයට බුසල් 93 ක් ලබා දුන් අතර තෙත් කලාපය තුළ අක්කරයට බුසල් 81 ක් ලබා දුනි. මෙම වී වර්ගය ගොක් මැස්සාගේ හානියට ප්‍රතිරෝධී හෝ මධ්‍ය ප්‍රතිරෝධී වන අතර දුඹුරු පැළ කීඩැවට මධ්‍ය ප්‍රතිරෝධී වේ. එමෙන්ම කොළ පාළුව රෝගය සඳහා මධ්‍ය ප්‍රතිරෝධී හෝ ප්‍රතිරෝධී වන අතර බැක්ටීරියානු කොල අංගමාරය සඳහා මධ්‍ය ග්‍රාහී වේ.

උස සෙ.මී. 79 ක් පමණ වන මෙම වී වර්ගය ඇද වැටීමට බඳුන් නොවන නිසා යාන්ත්‍රික අස්වනු නෙලීම සඳහාද යෝජ්‍ය වේ. අනෙක් විශේෂත්වය නම් මෙම වී වර්ගය සැලකිය යුතු නෙරි අස්වැන්නක් ද ලබාදීමය. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ආර්ථික විද්‍යා අංශයේ ආර්ථික විද්‍යාඥ ආර්. වලිසිංහ මෙනවිය ඇතුළු නිලධාරීන් පිරිසක් 2013 වර්ෂයේදී කරන ලද සමීක්ෂණයකදී මෙම වී වර්ගය වවන ලද ගොවි මහතුන්ගෙන් 88% ක්ම ජල හිඟ තත්ත්ව පවතින ප්‍රදේශ සඳහා මෙම වී වර්ගය යෝග්‍ය වන බව පවසා ඇත.

මෙම වී වර්ගයේ වර්ධක කාලය දින 15 - 20 ක් වැනි කුඩා කාල පරාසයකට සීමා වන නිසා පැළ මැක්කාගේ හානිය දක්නට ලැබුණහොත් ඒ සඳහා මර්ධන ක්‍රම යොදා ගත යුතුමය. පැල මැක්කන් සඳහා බීජ ප්‍රතිකාර යෙදීම වඩාත් සුදුසුය. එලෙසම මාස 2.5 වී ප්‍රභේද වලට අදාල පොහොර නිර්දේශය නියමිත දිනටම යෙදීමෙන් වඩා සාර්ථක අස්වැන්නක් ලබා ගත හැක. 2014 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ භෝග වර්ග නිර්දේශ කිරීමේ කමිටුව විසින් Bg 251 ලෙස මෙම වී වර්ගය නිර්දේශ කරන ලදී. මෙම වී වර්ගය ගොවි

29 පිටුවට...

මීට අමතරව කෘෂිකර්ම පර්යේෂණ කටයුතු වල නියැලී සිටින්නන්ගේ භාරදූර වගකීමක් වන්නේ ඉහළ උෂ්ණත්වයට, ජල හිඟතාවයට හා පළිබෝධ හානි වලට ප්‍රතිරෝධී (Resistant) හෝ යම් මට්ටමකට දරා ගත හැකි (Tolerant) ප්‍රභේද බිහි කිරීමයි. ඒ සඳහා මේ වන විටත් පර්යේෂණ දියත් කර ඇත.

කෙසේ වුවද අප මතකයේ තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ මෙම අනුවර්තිත පාලන ක්‍රම වල ප්‍රතිඵල ඇතැම් විට ක්ෂණිකව දැක ගැනීමට නොහැකි වීමයි. එම නිසා ඉවසීමෙන් යුතුව දීර්ඝ කාලීනව එම පිළිවෙත් භාවිත කිරීමට උනන්දු විය යුතුය. ඇතැම් ක්‍රමවේද ප්‍රායෝගිකව තරමක් අපහසු වීමට ඉඩ තිබුනද, දේශගුණික වෙනස්වීම් හේතුවෙන් මතුවන අනාගත අභියෝග ජය ගැනීමට නම් මේවා ක්‍රියාවේ යෙදවීම අත්‍යාවශ්‍ය වේ. නැතහොත් කෘෂිකාර්මික ව්‍යවසායිතාව පමණක් නොව පෘථිවිය මත ජීවයේ විස්ථායී බවට ද දැඩි තර්ජන එල්ල විය හැකිය.

තවද මෙම විවිධ ශෂ්‍ය විද්‍යාත්මක පාලන ක්‍රමයන්ගේ සාර්ථකත්වය තැනින් තැනට වෙනස් විය හැකි බැවින් තම ප්‍රදේශයට ගැලපෙන ක්‍රමය පර්යේෂණ තුළින් මෙන්ම ප්‍රායෝගික අත්දැකීම් තුළින්ද දැනුවත් වීම වැදගත් කාරණයකි.


**ගොවිකම් සඟරාවට එක් කළේ**

එම්. ඒ. පී. ඩබ්. කේ. මලවිආරච්චි

ශෂ්‍ය විද්‍යාඥ

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය

මහඉලුප්පල්ලම


**15 පිටුවෙන්...**

ජනතාවට හඳුන්වා දීමේ මූලික අරමුණ වන්නේ දැනට පවතින වී ප්‍රභේද සමඟ තරඟකාරීව වැඩි අස්වැන්නක් ලබා දීම නොව යල් කන්නයේදී උග්‍ර ජල හිඟයක් පවතින වර්ෂා පෝෂිත ප්‍රදේශ වල අවදානමට ලක්වීම අවම කර සාර්ථක වී අස්වැන්නක් ලබා දීමයි.

CSR ව්‍යාපෘතියට හා මෙම වී ප්‍රභේදයට අදාළ පර්යේෂණ කටයුතු සාර්ථක කර ගැනීමට 2008 සිට 2011 වසර දක්වා ශෂ්‍ය විද්‍යා අංශයේ පර්යේෂණ නිලධාරී ලෙස සේවය කළ හා වර්තමානයේ මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර භෝග පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්. එම්. ඩබ්. වීරකෝන් මහතාගේ හා වර්තමාන වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ආර්. එස්. කේ. කීර්තිසේන මහතාගේ අධීක්ෂණය හා මඟපෙන්වීම මහගු අත්වැලක් විය. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කළ ආචාර්ය ඩී.එම්.එන්. දිසානායක මහතා එස්. ඩබ්. අබේසේකර මහතා සහ වර්තමාන අධ්‍යක්ෂ ආචාර්ය අමිතා පී. බෙන්තොට මහත්මියගේ මෙම පර්යේෂණ කටයුතු සඳහා වූ දිරි ගැන්වීම ගෞරවනීයව සිහිපත් කරමි. ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර කටයුතු වලදී තාක්ෂණ සහකාර ගීතිකා මහත්මිය ඉතා කැප වීමෙන් දායකත්වය ලබා දුන්නාය. ගොවි ක්ෂේත්‍ර අත්හදා බැලීම් වලදී ඒ සඳහා නොමසුරු සහයෝගය ලබා දුන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පලාත් කෘෂිකර්ම කලාපවල සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්, කෘෂිකර්ම උපදේශක නිලධාරී මහත්ම මහත්මීන් සහ ගොවි මහත්ම මහත්මීන් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ශෂ්‍ය විද්‍යා අංශයේ වර්තමාන සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ටී. කේ. ඉලංගකෝන් මිය, තාක්ෂණ සහකාර එම්.ඩී. අබේසුන්දර මයා ජේ. එම්. පී. එන්. පී. සෝමරත්න මෙය. ඇතුළු කාර්ය මණ්ඩලය හා කීට විද්‍යා අංශය, ව්‍යාධි විද්‍යා අංශය සහ ධාන්‍යය ගුණාංග අංශයන්හි කාර්ය මණ්ඩල සහයෝගයද කෘතවේදීව සිහිපත් කරමි.